*** ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1). පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් තෝරාගෙන වචන 150 නොඅඩු රචනා දෙකක් ලියන්න.

(අ). අතීත ජන ජීවිතය පිළිඹිබු කරන අපේ ජන කවි.

(ආ). මා කැමති ජාතික වීරයා .

(ඇ). දේශීය ආහාර පරිභෝජනයට හුරු වෙමු.

(ඈ). ජල සම්පත සුරකිමු.

(ඉ) . පොත්පත් කියවා නැණ ගුණ වඩමු.

- **ඔබේ සිංහල පෙළ පොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.(පිටු අංක යොදා ඇත.)**

(2).1. එළඹෙන පාසල් නිවාඩුවේ දී පවුලේ සාමාජිකයන් සමඟ දෙහිවල සතුන් වත්න නැරඹීම සඳහා යාමට ඔබ අදහස් කරයි. එම ගමනට ඔබ හා එක්වනලෙස දන්වමින් දුර බැහැර සිටින මිතුරෙකුට / මිතුරියකට ලිපියක් ලියන්න.

2. ප්‍රදේශයේ මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීමට සිතන ඔබ ඒ සඳහා අවශ්‍ය ඉල්ලුම් පතක් හා විස්තර ලබා දෙන ලෙස ඉල්ලමින් පුස්තකාලයාධිපතිට යවන ලිපියක් ලියන්න

(පිටු අංක 21)

(3). විදුහලෙන් මාරු වී ගිය ඔබ සිත් ගත් ගුරුතුමෙකුගේ / ගුරුතුමියකගේ උපන් දිනයට යවන සුබ පැතුම් පතක් සකස් කරන්න.

(පිටු අංක 19)

(4). කොරෝනා උවදුරෙන් ඔබ ගමේ කිහිප දෙනෙකු මරණයට පත් වී ඇත. කොරෝනා වෛරසය බෝවීම වැළැක්වීමේ උපදෙස් නොපිළිපැදීම ඊට හේතුවී ඇත. මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටරයක් සකස් කරන්න.

(5). ඔබ කැමති මාතෘකාවක් / තේමාවක් තෝරාගෙන කවි 5ක් නිර්මාණය කරන්න.

(පිටු අංක 9)

(6). අක්ෂර මාලාව නිවැරැදිව ලියන්න.

(පිටු අංක 24)

(7). "තුන් බෑ යෝධයෝ" කතාවේ ඇතුළත් නාම පද පුරුෂ ලිංග , ස්ත්‍රී ලිංග , නපුංසක ලිංග වශයෙන් වර්ග කර දක්වන්න.

(පිටු අංක 38)

www.lkedu.lk